# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1718/1 – 2011 අගෝස්තු 08 වැනි සඳුදා – 2011.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 134ඩී බඹරගොඩ ග්‍රාම නිලධාරි වසමේ පනාගමුව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මු.පි.ගා 3826 හා 2010.11.10 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 2.2016 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

**කැබලි අංක 01**

ඉඩමේ නම: වලහන්දූව වත්ත (අක්කර 05); විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 41ක් සහ බුදු මැදුරක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්. 2.2016.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ඔක්තෝබර් මස 10 වැනි දින පෙ.ව. 10.00ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 ඔක්තෝබර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

දමයන්ති පරණගම,
ප්‍රාදේශීය ලේකම්.
අක්මීමන.

2011 අගෝස්තු මස 03 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 571

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 152 පිලාන ග්‍රාම නිලධාරි වසමේ මීගොඩ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මු.පි.ගා 3787 හා 2010.09.26 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 11.0125 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

*සැ. යු.– අතිවිශෙෂ ගැසට් අංක 1717/1 කාණ්ඩය අංක 1717/41 න් අවසන් වේ.*

***கவனிக்க.*** *– 1717/1 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியின் இறுதியிலக்கம் 1717/41.*

***N. B.*** *– Gazette Extraordinary* Series No. 1717/1 ends with No. 1717/41.

**කැබලි අංක 01**

ඉඩමේ නම: කැරුන්කැටිය (හරිතගම); විස්තරය: ගෙවත්ත, අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 110ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්. 11.0125.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ඔක්තෝබර් මස 12 වැනි දිනපෙ.ව. 10.00ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 ඔක්තෝබර් මස 05 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

දමයන්ති පරණගම,
ප්‍රාදේශීය ලේකම්.
අක්මීමන.

2011 අගෝස්තු මස 03 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

08 - 572

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 135 ඒ මීගොඩ ග්‍රාම නිලධාරි වසමේ මීගොඩ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මු.පි.ගා 3786 හා 2010.08.17 දිනැති පිඹුරේ කැබලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 3.7485 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි:

**කැබලි අංක 01**

ඉඩමේ නම: ගොඩදෙනිකන්ද; විස්තරය: ගෙවත්ත, අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 27ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්. 2.8591.

**කැබලි අංක 02**

ඉඩමේ නම: ගොඩදෙනිකන්ද; විස්තරය: සුසාන භූමිය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්. 0.8894.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ඔක්තෝබර් මස 17 වැනි දින පෙ.ව. 10.00ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 ඔක්තෝබර් මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

දමයන්ති පරණගම,
ප්‍රාදේශීය ලේකම්.
අක්මීමන.

2011 අගෝස්තු මස 03 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 573

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.